සන්නස SANNASA



# වික්ටර් ගී විමංසා

## සිසිර දිසානායක

'වික්ටර් ගී විමංසා' ග්‍රන්ථය එළිදැක්වී දෙවසරක් ගතවීම නිමිත්තෙනි

සම්මානිත මහාචාර්ය
**කුසුමා කරුණාරත්න**

''ගීතයෙහි සාහිත්‍ය පාර්ශ්වයෙහි හිමිකරුවෝ ගේය කාව්‍ය රචකයෝය. ඒත් ඔවුන්ගේ රචනා ශ්‍රාවකයන් වෙත රැගෙන යන්නේ ගායන ශිල්පියෝය. නිසැක වශයෙන්ම වික්ටර් රත්නායකයන් නිසා ගීත සාහිත්‍යයෙහි නව ප්‍රවණතාවක් බිහි වුයේය. බොහෝ වෙහෙස මහන්සි වී සිසිර දිසානායක සම්පාදනය කර ඇති මේ කෘතියෙන් තැත් දරනුයේ එකී ප්‍රවණතාව හඳුනාගැනීමටය, විමසීමටය, රස විඳීමටය.''

මහාචාර්ය සුනිල් ආරියරත්න විසින් වික්ටර් ගී විමංසා කාතියට ලියන පසුවදනෙන් ගත් උක්ත උද්ධෘතය එම කෘතිය පිළිබඳවත් එහි කතුවර සිසිර දිසානායක පිළිබඳවත් පාඨකයාට යම් අදහසක් ලබාදෙයි. ශ්‍රී ලංකා මාතාව බිහි කළ ශ්‍රේෂ්ඨ පුත්‍රරත්නයන් අතුරින් සංගීත ක්ෂේත්‍රයෙහි ඉහළින්ම වැජ‌ඹෙන්නවුන් ගැන සිහි කරන විට ආචාර්ය වික්ටර් රත්නායක එහි ප්‍රමුඛ පෙළට අයත් වන්නෙකි. සිය සංගීත ජීවිතයේ අත්පොත් තැබූ දා පටන් මේ දක්වා ඔහු විසින් ඉටු කරන ලද මෙහෙවර අනන්තය, අප්‍රමාණය. ඒගැන මැනවින් දන්නා හඳුනන එම මෙහෙවර අගය කරන කොතෙකුත් රසිකයන් අප රට ඇතත් ඒ පිළිබඳව මෙබඳු විමර්ශනයකට යොමු වුවෙක් නැති තරම්ය.

තම බාල වියේ පටන්ම වික්ටර් රත්නායක ගායකයාණන්ගේ මිහිරි හඬටත්, ගායනයෙන් ප්‍රකට කළ විශිෂ්ට කුසලතාවටත් ආකර්ෂණය වෙමින් එදා මෙදා තුර එම ගී රස විඳීම, ඇගයීම හා එයට ගෞරවාන්විත ඇල්මක් දැක්වීම අතින් සිසිර දිසානායක පෙරමුණ ගන්නේ යැයි කීම මුසාවක් හෝ අධිතක්සේරුවක් හෝ නොවේ. මුලින්ම අම්මාගෙන් සිංහල විෂය පිළිබඳ දැනුමක් තාත්තාගෙන් සංගීතඥාණයත් ලද සිසිර වර්තමානයේ ඉංජිනේරු වෘත්තිකයෙකි.

කතුවරයාම පවසන පරිදි ''රසිකයෙකු ලෙස උන්මාදයෙන් ඇදහූ වික්ටර් රත්නායකයන්ගේ මිහිරි තනුවකින්, සංගීතයෙන් සහ මධුර හඬින් රචකයෙකු ලෙස නොදැනුවත්වම'' දොරට වැඩීමේ සුභ ආරංචිය ඔහුගේ ජීවිතයේ වැදගත්ම අවස්ථාවක් විය. එසේ ආරම්භ වූ ගී පද රචනා මාවගේ ඉදිරියට ගමන් කළ සිසිර මේ වන විට ලේඛකයෙකි, ගත්කතුවරයෙකි විශිෂ්ට කෘතියක රචකයෙකි. ''වික්ටර් ගී විමංසා'' ඔහු අතින් ලියවුණු අගනා ශාස්ත්‍රීය ග්‍රන්ථයක් ලෙස අද පමණක් නොව මතු අනාගතයේ ද සංගීත විෂයට අදාළ වටිනාම ශාස්ත්‍රීය කෘතියක් ලෙස ප්‍රකට වනු ඇත.

''වික්ටර් ගී විමංසා'' කෘතිය වසර දහයකටත් අධික කාලයක් තුළදී දරන ලද



පරිශ්‍රමයක මහගු ප්‍රතිඵලයකි. එමෙන්ම, එම දස වසරට පූර්වයෙහි පටන් ගීතයට, සංගීතයට මෙන්ම වෙසෙසින්ම වික්ටර් රත්නායක නමැති අගනා ගායකයාණන්ට දැක්වූ ඇල්ම හා ගෞරවය සමග සිසිර වෙත වූ සහජ හැකියාව යන මේ සියලු සාධකයන්හි මල් පල ගැන්වීමක් ද මෙම කෘතිය තුලින් විද්‍යාමාන වෙයි. විමර්ශනවලට අමතරව කතුවරයා උද්දාමයට පත්ව සිටින තවත් කරුණකි. එනම් එදා පටන් ම තම වෙසේන්ම අගය කළ ගායකයකු වන වික්ටර් රත්නායක කෙරෙහි තම හදවතේ මතු වූ ළෙන්ගතු බව විශද වන තවත් අංගයකින් මෙම කෘතිය වර්ණවත් කරන්නට හැකි වීමයි. ඔහුගේම වචන වලින් කිවහොත් දිය සායමින් සිත්තම් වූ සිය මුල් ම වර්ණ ආලේඛ්‍ය සිතුවම ද ඒ කතුවරයා අතින්ම කංචුකය වෙනුවෙන් නිර්මාණය වීම ඒ අමතර කරුණයි.

සුරස වසර දහයක් තිස්සේ දුටු සිහිනය විධිමත්ව, ගුණාත්මකව සහ ප්‍රමිතියකට අනුව සැබෑ කර දුන් සුරස ප්‍රකාශයන්ට තම සිත තුළ සටහන් කෘතඥතා පූර්වක හැඟිම් පළ කරන කතුවරයා එමගින් පාඨක අපට පවසන්නේද එම කෘතියෙහි විධිමත් ප්‍රමිතිගත හා ගුණාත්මක භාවය ගැනයි. ප්‍රකාශකයකුගේ එම කාර්යය පහසු කරවීම සඳහා කතුවරයා මෙහි අන්තර්ගත සියලු කරුණු මැනවින් පෙළගස්වා තිබීම පාඨකයාට අවබෝධ කරගැනීමද අතිශය පහසු කාර්යයකි.

මෙවන් විශිෂ්ට ගායකයකුගේ කීර්තිමත් නාමය තවතවත් බැබළවීමට බෙහෙවින් යෝග්‍ය වන පරිද්දෙන් කතුවරයා මෙහි අන්තර්ගතය සකසාගෙන ඇත. ආචාර්ය ප්‍රණීත අභයසුන්දර මෙම කෘතියට පෙර වදනක් සපයමින් කියා පානා එක් කරුණක් දෙස අවධානය යොමු කරන විට ''වික්ටර් ගී විමංසා'' කෘතියෙහි ගැඹුර මෙන්ම අගය ද විශද වන්නේය. ''මේ අප්‍රමාණ සංගීත වේදියාණන් කළ කී දෑ වත ගොත මතිමතාන්තර ගැන කරුනු අපි කුඩා කාලයේ පටන් කියවා ඇත්තෙමු. මා ද ඇතුලුව බොහෝ දෙන එම නිර්මාණ රසමංජරිය එකතු කොට සුරක්ෂිතව තබාගෙන හදාරමින් සිටිමු. තවමත් කියවා නිම කළ නොහැකි රසවාහිනී ග්‍රන්ථයක් බඳු මේ අද්විතීය සංගීත කලාවේදියාණෝ චමත්කාරජනක වේදයිත ඉස්මතු කළ අග්‍රගණ්‍ය සංගීත ප්‍රණීතාංගයකි.'' ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර නිවැරදිව දක්වන තවමත් කියවා නිම කළ නොහැකි.... යන යෙදුමෙන්ම වික්ටර් රත්නායක සංගීතවේදියාණන්ගේ අතිශය ගැඹුරු හා පුලුල් කාර්යභාරය පිළිබඳව පැහැදිලි වෙයි. බාල වියේ සිට හැදෑරීම ඇගයීම හා ඇසුරු කිරීම යන මේවාට අමතරව මෙම ග්‍රන්ථය රචනා කර නිම කිරීම පිළිබඳ සිසිර දිසානායක දස වසරකට අධික කාලයක් පුරා දුටු සිහිනයක් සැබෑවීමේ යහපත් ප්‍රතිඵලය ගැනත් සලකවිට මෙම සමස්ත කර්තව්‍යයෙහි විශාලත්වය අවබෝධ කරගත හැකිය.

කවර විෂයයක් ගැන හෝ විමර්ශනය කරමින් පර්යේෂණ කරමින් ගොස් එ හි ප්‍රතිඵල ග්‍රන්ථයක් මගින් පාඨකයාට ඉදිරිපත් කිරීමේදී කරුණු ගොනු කරගන්නා ආකාරය මෙන්ම එහි විධිමත් සැලැස්ම ද එම ග්‍රන්ථයේ සාර්ථකත්වය කෙරෙහි බලපායි. මෙම කෘතියෙහි මුඛ්‍යාර්ථය වන්නේ අදාල ගායකයා විසින් ගයන ලද අති විශාල සංඛ්‍යාවක් වන ගීත පෙළගැස්ම මෙන්ම ඒවා පිළිබඳ සංගීතමය විවරණ ඉදිරිපත් කිරීමත් ඒ සමගම ගායකයා සහ ගත් කතුවරයා අතර විටින් විට ඇති වු කතිකාවන් ද යෝග්‍ය පරිදි එක් කරගනිමින් ඒ සියල්ල පිළිබඳ විමර්ෂනයක යෙදීමයි. මෙම සැලැස්ම වෙනුවෙන් කතුවරයා සෑහෙන තරම් කල් ගත කළා පමණක් නොව විධිමත් අයුරින් එක් එක් කොටස් වෙන් කර දක්වන්නට ද සමත් වී ඇත. ''වික්ටර් ගී විමංසා'' කෘතියෙහි පරිච්ඡේද සඳහා සිංහල හෝඩියේ අකුරු අනුපිලිවෙලින් යොදා ගැනිමට කතුවරයා යොමු වී තිබීම මෙම කෘතියෙහි විශේෂත්වයකි.

ඒ අනුව මෙහි (අ) යන්නෙන් ඇරඹෙන ''පිවිසුම'' මගින් අප ගායකයාණන්නේ විශේෂිත වූත්, විශිෂ්ට වූත් (''ස'' ප්‍රසංගය) පිළිබඳ නාට්‍යෝචිත ඉදිරිපත් කිරීමක් සිදු කර ඇත. සමස්ත ග්‍රන්ථයේම දක්නට ලැබෙන සුන්දර, රසබර, කාව්‍යමය ශෛලිය මෙම ''පිවිසුම'' ට පිවිසෙන සහෘද පාඨකයාට හඳුනාගත හැකි වනු ඇත. ගී පද රචනයෙහි ගව් ගණනක් ඉදිරියට ගොස් සිටින සිසිර තම කෘතියෙහි රචනා ශෛලීය ද එවන් මිහිරි බස් වහරකින් යුතු යෙදුම්වලින් සරසා ඇති අයුරු අපූරුය. ''සම්බුද්ධ සද්ධර්ම අනුහසින්'' හා ''උල්පත'' යනුවෙන් දෙකොටසකින් සමන්විත ''පිවිසුම'' පුරාම කතුවරයා රසික මනස තුළ ආස්වාදය ජනිත කරමින් රත්නායක නිර්මාණ පෙළහරට අයත් ගිත සමූහයක් පිළිබඳ සඳහන් කරයි.

එහි දෙවන අදියර වන උල්පතක උපත මගින් අප ගායකයාණන් හා පුරා කියා සංගීත භාණ්ඩයක (සර්පිනාවක) හිමික රුවීමේ සංවේදී එහෙත් රසවත් පුවත කතුවරයා තම කෘතියට ඇතුළත් කර තිබෙන්නේ ද එයින් ඉදිරියට ද මෙම ග්‍රන්ථය කියවීමට පාඨකයා වඩවඩාත් උනන්දු කරමිනි. එකී ආරම්භය වික්ටර් රත්නායක ගායකයාණන් අද්විතිය යුග පුරුෂයකු බවට පත් වූ අයුරු පිළිබඳ කෙටි සටහනකින් කෘතියේ පිවිසුම නිමා වෙයි.

''වික්ටර් ගී විමංසා'' නම් වු මෙම දැවැන්ත කෘතියේ දෙවන අදියර (ආ) ''ගි රස හව්'' නමින් නම් කරන කතුවරයා ''යොමුව'', ''ගීයක ආකෘතිය'', ''තනු නිර්මාණය'', ''ධ්වනි විද්‍යාවෙන්'' යන උප සිරැසිවලින් එය හැඩ ගන්වා ඇත. කතුවරයා කුඩාවියේ පටන්ම වගා දිගා කරගත් සංගීත ඥාණය, සංගීතය දත් නොදත් සියලු පාඨකයන්ගේ යහපත තකා මැනවින් විග්‍රහ කරමින් මෙම (ආ) කොටස සම්පාදනය කර ඇත. ගීයක ආකෘතිය ගැන මෙන්ම ගීතවල පද පෙළ ස්වර ප්‍රස්තාර ආදිය ද පැහැදිලිව ගෙන හැර දැක්වීමට කතුවරයා අපූරු සමත්කමක් පෙන්වා ඇත.

වික්ටර්ගේ මියුරු හඬින්, කාලාන්තරයක් තමන්ගේ ගැයුණු ගි, බොදු ගී, කිතුනු ගී, මව්ගුණ ගී, පිය ගුණ ගී, දේශාභිමානී ගී, උදාන ගී, ආදි වශයෙන් වර්ග කරමින් පුලුල් විමර්ශනයක යෙදෙන සිසිර දිසානායක ඒ සෑම තැන්හිදීම පාහේ පාඨකයා මන්මත් කරවන පරිද්දෙන් එම විග්‍රහයන් කර තිබි මෙන් මෙම කෘතියේ අගය දෙගුණ තෙගුණ වි ඇත.අද අප අතර ඉතිරිව ඇති සිංහල සුභාවිත ගීත සමූහය දායාද කළ විශිෂ්ට පද රචකයන්ට හරසර දැක්වෙන සේ එම ගීත පිළිබඳ කෙරෙන විග්‍රහය මෙහිදී ආචාර්ය වික්ටර් රත්නායක ගායකයාණන්ගේ මහිමය ද තව තවත් ඉහළ නංවයි.

අප ගායකයා ගැයූ විශාල සාංඛ්‍යාවක් වන ගී යුග ගී, දරුවන් සමග ගැයූ ගි පිළිබඳව ද මෙම කෘතිය පාඨක අපට අගනා තොරතුරු රැසක් හෙලි කරයි. ''වික්ටර් ගී විමංසා'' කෘතියේ හාරසිය අසු අටවන පිටුවේ ඇතුළත් වන ''උණුසුම් තුරුළේ'' නම් ගීතය පිය පුතු දෙපළකගේ සංවාදයක ස්වරූපයෙන් ගැයෙන මනහර ගීයකි. ළමා ගි පද මාලා මෙලෙසින් ගැයුමෙන් ආලෝකවත් වු අයුරු, අසන, දකින, කියවන රසිකයන්ගේ මනස තව තවත් සංවේදී වෙමින් එහි ගි මිහිරෙන් ඔකඳ වනු නොඅනුමානය. ආචාර්ය වික්ටර් රත්නායක ගායකයාණන් විදෙස් පරිසරයකදි සිංහල නිවැරදිව හසුරුවන්නට උත්සාහ ගන්නා දරු පිරිසකට සහාය වෙමින් ගැයූවකි. ''සුදු දුවේ'' නම් ගීතය, ''සුදුයි ද මං අප්පච්චි හැමෝම මට සුදූ කියන්නේ?'', ''තළෙලු වුණත් සුදුයි දුවත් හැමදාමත් හොඳ ළමයෙක්නම්'' (490 පිට)

**වික්ටර් ගී විමංසා නම් වු මෙම අගනා කෘතිය සිසිර දිසානායක විසින් රචනා කරන ලදුව ප්‍රකාශයට පත් වුයේ 2017 වසරේ පෙබරවාරි මාසයේදීය.**

**එතැන් පටන් මේ දක්වාම, සංගිත ක්ෂේත්‍රයෙහි නිපුණත්වය ඇත්තන් කොතෙකුත් මෙය කියවා රස විදගන්නටත්, මෙහි අගය අවබෝධ කරගන්නටත් ඇත. මෙම සටහන තබන මා වැනි සංගීත ඥාණයෙන් පරිපූර්ණ නොවුවකු අතින් ලියවෙන විවරනයකට වඩා සංගිත ක්ෂේත්‍රයෙහි විද්වත් විචාරකයෙකු අතින් ලියෙවෙන විමසුමක් කොතරම් නම් අගේද?**